# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2344/12 – 2023 අගෝස්තු මස 07 වැනි සඳුදා – 2023.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2021/100.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.10.15 දිනැති හා අංක 2301/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.06 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තුම්මෝදර, ගැටේමාවරය, අංක 114/ එෆ් හි පදිංචි අයි. ඩී. එස්. සමරනායක මයා සහ කොළඹ 15, රොක් හවුස් පටුමඟ, අංක 15 හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වන වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 40069 – 20 (2023/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය: ඒ/63/ 2022.
1R /COM/04/2021/100.

අයි. ඩී. එස්. සමරනායක,
අංක 114/F,
ගැටේමාවරය,
තුම්මෝදර.

*පැමිණිලිකරු - පළමු පාර්ශ්වය*

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15,
රොක් හවුස් පටුමග,
කොළඹ 15.

*වගඋත්තරකරු - දෙවැනි පාර්ශ්වය*

වර්ෂ 2023 ක් වූ ජුනි මස 07 වැනි දින දී ය.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2022. 10. 06 දරන ලිපියෙන් මා පත්කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණු කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රකාශයට අනුව පහත පරිදි වේ.

"ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ පැරණි බඳවා ගැනීමේ පටිපාටියෙන් වසර 5 න් 5 ට ලබාදෙන උසස්වීම් අනුව 1996.01.28 දින සිට කොන්ත්‍රාත් පදනමෙන් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත ආරක්ෂක නිලධාරියෙකු ලෙස සේවයට බැඳී සේවය කළ අයි. ඩී. එස්. සමරනායක මහතාට 2001 වසරේ සිට 2019.11.06 දක්වා විශ්‍රාම ගැන්වෙන අවස්ථාව වන විට උසස් වීම් ලෙස 2001 වසරේ දී OIC තනතුර ද 2006 වසරේ දී CSO තනතුරේ ද 2011 වසරේ දී A/D තනතුරේ ද 2016. වසරේ දී S/D තනතුර ද යන තනතුරු හිමි ද හිමිනම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද, අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ".

ඒ අනුව විනිශ්වය කළ යුතු මුලික කරුණු හතරක් හඳුනාගෙන ඒ අනුව බේරුම්කරණ ක්‍රියාවලිය මගින් දෙපාර්ශ්වයේ ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමෙන් සහ සාක්ෂි විභාග කිරීමෙන් අනතුරුව සුදුසු සහනයන් ප්‍රදානය කිරීමට තීරණය කළෙමි.

01. OIC, CSO,A/D, S/D වශයෙන් වගඋත්තරකාර ආයතනයේ ආරක්ෂක අංශයේ තනතුරු ධූරාවලියක් තිබුනේද?
02. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව මගින් අවුරුදු 5 න් 5 ට සේවකයන්ට උසස්වීම් ලබාදෙන ආකාරයේ පටිපාටියක් තිබුනේ ද?
03. අදාළ ආයතනයේ උසස්වීම් ලබා දීමේ පටිපාටියක් තිබුනේ නම් පළමු පාර්ශ්වය වෙනුවෙන් උසස්වීම් ලබාදීම සාධාරණ ලෙස

ක්‍රියාත්මක කර ඇත් ද?

04. එසේ සාධාරණ ලෙස කටයුතු කර නොමැති නම් පළමු පාර්ශ්වය වෙත ලබාදිය හැකි සහනයන් කවරේද යන්න තීරණය කිරීම.

පළමුව දෙපාර්ශ්වය වෙතින් වෙන වෙනම කැඳවන ලද ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව වූ ලිඛිත විස්තර ප්‍රකාශයන් සහ ප්‍රති උත්තර ප්‍රකාශයන් සලකා බලා දෙපාර්ශ්වය අතර ආරාවුල නිරවුල් කර ගැනීමට යම් එකඟත්වයක් ඇත් ද යන්න සොයා බැලීමට දෙපාර්ශ්වය සමග සාකච්ඡා කලෙමි. එම සාකච්ඡාවලදී දෙපාර්ශ්වය අතර ඇති එම ආරාවුල නිරවුල් කර ගැනීම සඳහා කිසිදු එකඟතාවයක් දෙපාර්ශ්වයටම නොමැති බව තහවුරු විය.

අනතුරුව දෙපාර්ශ්වයටම තම සාක්ෂි ඉදිරිපත් කරමින් කරුණු දැක්වීමට සාධාරණ අවස්ථාවක් ලබා දෙන අතර ඉදිරිපත් වූ ලිඛිත සහ වාචික සාක්ෂි විශ්ලේෂනය කරමින් නිගමනවලට එළඹීමට කටයුතු කළ ආකාරය ඉහත සඳහන් කරුණු හතර යටතේ පහත දක්වමි.

01. OIC, CSO,A/D, S/D වශයෙන් වගඋත්තරකාර ආයතනයේ ආරක්ෂක අංශයේ තනතුරු ධූරාවලියක් තිබුනේද?

1997 වර්ෂයේ සිට මෙම ආයතනයේ ආරක්ෂක අංශයේ තනතුරු ධූරාවලියන් පවත්වාගෙන ගොස් ඇති බව ඉදිරිපත් වූ සාක්ෂි අනුව අනාවරණය විය.

1972 වර්ෂයේදී ආරම්භ කරන ලද ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ආරක්ෂක සේවය ආරම්භ කරන ලද්දේ 1995 සිට වුවද එය නීත්‍යානුකූලව සංස්ථාපිත කර ඇත්තේ 1997 වර්ෂයේ සිටය. ඉන්දික ගුණවර්ධන එවකට සිටි ගරු අමාත්‍යවරයා විසින් 1997.01.06 දින ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට අනුමැතිය ලැබීමෙන් පසුව මෙම ආරක්ෂක සේවය ස්ථාපිත වී ඇත. එතැන් සිට ආරක්ෂක සේවයේ නියුතු සේවකයන්ට වැටුප් ගෙවා ඇත්තේ පඩි පාලක සභා ආඥාපනත මගින් පිහිටුවා ඇති ආරක්ෂක සේවා කර්මාන්තයේ පඩිපාලක සභා තීරණ අනුව වේ. පඩිපාලක සභා තීරණ අනුව ආරක්ෂක සේවා කර්මාන්තයේ සේවකයින් පහත සඳහන් පරිදි වර්ගීකරණයකර වැටුප් නියම කර ඇත.

01. පාලනමය සේවාවන් :
- I. OIC ( ස්ථාන භාර නිලධාරී - Office incharge)
- II. VSO ( සංචාරක ආරක්ෂක පරීක්ෂක නිලධාරී - Visiting Security Supervising Officer)
- III. SSO (Security Supervisor)

ක්‍රියාකාරී සේවාවන් :
- I. S.O. (ආරක්ෂක නිලධාරීන්)
- II. JSO (කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි)

මෙම වර්ගීකරණය සහ තනතුරු නාමකරණය 2001 දක්වා පවත්වාගෙන ගොස් ඇත.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් වැඩ බලන මානව සම්පත් කළමනාකරු සාක්ෂි දෙමින් 2001 වර්ෂයෙන් පසුව සහ 2006 වර්ෂයට පෙර මෙම ආයතනයේ ආරක්ෂක අංශයේ තනතුරු ධූරාවලිය පහත සඳහන් පරිදි තිබී ඇති බව පිළිගෙන ඇත.

| | | | | |
|---|---|---|---|---|
| I. | S/D | - Security Director | - | ආරක්ෂක සේවා අධ්‍යක්ෂක |
| II. | S/D | - Assistant Director | - | සහකාර අධ්‍යක්ෂක |
| III. | VSO | - Visiting Supervising Officer | - | සංචාරක ආරක්ෂක සුපවයිසර් |
| IV. | CSO | - Chief Security Officer | - | ප්‍රධාන ආරක්ෂක නිලධාරි |
| V. | OIC | - Officer in Charge | - | ස්ථානභාර නිලධාරි |
| VI. | SSO | - Senior Security Officer | - | ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි |
| VII. | JSO | - Junior Security Officer | - | කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි |

ප්‍ර : ඔබ විසින් ඉදිරිපත් කරන ලද 2001 සේවා ව්‍යවස්ථාවේ අංක 132 සිට 134 දක්වා තනතුරු අතරින් සමරනායක මහතාට ස්ථානාධිපති ආරක්ෂක (OIC) සහ සංචාරක ආරක්ෂක නිලධාරි (VSO) තනතුරු නොලැබුණ බව සඳහන් කිරීම ඔහුගේ දැනුමේ හැටියට මෙම තනතුරු දෙකට අමතරව ඔහුගේ ඉල්ලීමේ සඳහන් ප්‍රධාන ආරක්ෂක නිලධාරි (CSO) ලෙස කරන ලද ඉල්ලීම සහ සහකාර අධ්‍යක්ෂක (AD) සහ අධ්‍යක්ෂක ආරක්ෂක (SD) කියන තනතුරු ඉල්ලා ඇත්තේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් වීමේ ක්‍රමය 2006 වසරෙන් පසුව ක්‍රියාත්මක වූ බව නොදැන බව පිළිගන්නවාද?

උ : පිලිගන්නවා

(2023.03.10 දින සාක්ෂි සටහන් පිටු අංක 13)

මූලික සාක්ෂි විභාගයේදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් වැඩ බලන මානව සම්පත් කළමනාකාරවරයා ඉහත සඳහන් ආරක්ෂක අංශයේ තනතුරු ධූරාවලිය 2001 වසරේ සිට පැවැති බව තවදුරටත් තහවුරු කර ඇත.

ප්‍ර : ආරක්ෂක සේවාව ස්ථාපිත කළේ කවදා ද කියා ඔබ දන්නවා ද?

උ : 1995

ප්‍ර : ආරක්ෂක සේවාව ස්ථාපිත වූයේ කොහොමද කියලා ඔබ දන්නවා ද? ආරක්ෂක සේවාව ස්ථාපිත වෙලා තියෙන්නේ ඉන්දික ගුණවර්ධන අමාත්‍යවරයා 1997.01.06 වැනි දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ලැබිච්ච අනුමැතිය හැටියට කියලා පිළිගන්නවා ද?

පි : ඔව්

ප්‍ර : 1997 න් පස්සේ ඒ වන විටත් බඳවාගෙන සිටි ආරක්ෂක නිලධාරින්ට ලබාදුන්න තනතුරු මොනවාද? කියලා ඔබ දන්නවා ද?

පි : කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ස්ථානභාර නිලධාරි, ආරක්ෂක පරීක්ෂක.

ප්‍ර : ආරක්ෂක කර්මාන්තයේ (Security trade p ) පඩි පාලක සභාවේ නියම කරන ලද වැටුප් සඳහා හදපු තනතුරු වගයක් තිබෙනවා. ඒ අනුව සකසන ලද ලේඛනයක පැහැදිලිව තිබෙනවා මෙම ආයතනයේ Visiting Officer තනතුරු 3 ක් තිබෙන බව?

පි : ඔව්.

ප්‍ර : Officer in Charge තනතුරු 3 ක් තිබෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : Senior Security Officer තනතුරු 16 ක් තිබෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : Junior Security Officer තනතුරු 120 ක් තිබෙනවා කියලා එතනින් Junior Security Officer කියන්නේ කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුර සමරනායක මහත්මයා බඳවා ගත්තේ එම තනතුරට කියලා පිළිගන්නවා ද?

පි : ඔව්.

ප්‍ර : ඔබතුමා මෙම තනතුරු තිබුණා කියලා පිළිගන්නවා ද?

පි : ඔව්.

(2023.02.06 දින සාක්ෂි සටහන්වල පිටු අංක 17)

මේ අනුව පැහැදිලි වන්නේ 1997 වර්ෂය දක්වා ආරක්ෂක අංශයේ පැවති තනතුරු ධූරාවලිය පහත සඳහන් පරිදි පැවති ඇති බවයි.

| | | | |
|---|---|---|---|
| I. | S/D | - | ආරක්ෂක සේවා අධ්‍යක්ෂක |
| II. | A/D | - | සහකාර අධ්‍යක්ෂක |
| III. | VSO | - | සංචාරක ආරක්ෂක සුපවයිසර් |
| IV. | CSO | - | ප්‍රධාන ආරක්ෂක නිලධාරි |
| V. | OIC | - | ස්ථානභාර නිලධාරි |
| VI. | SSO | - | ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි |
| VII. | JSO | - | කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි |

1997 සිට 2001 වර්ෂය දක්වා ආරක්ෂක අංශයේ පැවති තනතුරු ධූරාවලිය පඩිපාලක සභාවේ තීරණ අනුව හඳුන්වා දී ඇති තනතුරු නාම අනුව සැකසී ඇත.

i. පාලනමය සේවාවන් : a. OIC (ස්ථාන භාර නිලධාරි)
b. VSO (සංචාරක ආරක්ෂක පරීක්ෂක නිලධාරි)
c. SSO (ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි)

ii. ක්‍රියාකාරී සේවාවන් : d. S.O. ( ආරක්ෂක නිලධාරින්)
e. JSO ( කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි)

2001 වර්ෂයේ සකසා ඇති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවාගෙන නොමැති වුවද එහි දක්වා ඇති සමහර බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ක්‍රියාත්මක කර ඇත. එම 2001 බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ 15 වන පිටුවේ සඳහන් පරිදි වූ ආරක්ෂක අංශයේ තනතුරු අංක : 132 සිට 136 දක්වා නම්කර ඇත.

| | | | | |
|---|---|---|---|---|
| 132 | - | VSO | - | සංචාරක ආරක්ෂක පරීක්ෂක |
| 133 | - | OIC | - | ස්ථානභාර නිලධාරි |
| 134 | - | SSO | - | ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි |
| 135 | - | JSO | - | කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි |
| 136 | - | LSO | - | කාන්තා ආරක්ෂක නිලධාරි |

මෙම තනතුරු නාමයන් 2008. 04. 25 දිනැති 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් තනතුරු ශ්‍රේණිගත කිරීම දක්වා පවත්වාගෙන ගොස් ඇත. එනම් 2001 සිට 2006 දක්වා ආයතනය තුළ මෙම තනතුරු ප්‍රමාණයන් පහත සඳහන් පරිදි පවත්වාගෙන ගොස් ඇත.

| *තනතුර* | *සේවක සංඛ්‍යාව* |
|---|---|
| VSO | 03 |
| OIC | 03 |
| SSO | 16 |
| JSO (LSO ඇතුළුව) | 120 |

6/2006 රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛනය මගින් නියම කර ඇති පරිදි රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලයන් හි වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිකුත් කර ඇති කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුව මගින් නිකුත් කරන ලද 2006.09.22 දිනැති අංක 30 දරන චක්‍රලේඛනය සහ 2009.06.01 දිනැති අංක 30(1) චක්‍රලේඛනය පරිදි නිශ්චිත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සැදීමත් කාර්ය සාධනය පදනම් කරගත් උසස් වීමේ ක්‍රමයක් සහතික කිරීම හා ඒ සඳහා තනතුරු ශ්‍රේණිගත කිරීමත් සිදුව ඇත.

එම ශ්‍රේණිගත කිරීම අනුව ආරක්ෂක අංශයේ තනතුරු ධූරාවලිය පහත සඳහන් පරිදි වේ.

a) කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි III
b) කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි II
c) කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි I
d) ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි III
e) ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි II
f) ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි I
g) ආරක්ෂක පරීක්ෂක III
h) ආරක්ෂක පරීක්ෂක II
i) ආරක්ෂක පරීක්ෂක I
j) ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක II
k) ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක I

2006 වසරේ 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් මෙම තනතුරු සඳහා ශ්‍රේණි ක්‍රමයක් සහ ඒ අනුව වූ වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට පියවරගෙන ඇති අතර ඒ අනුව උසස්වීම් ලබාදීම සිදු කිරීමට එනම් ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කර ඇත.

ප්‍ර : ඒ අනුව කල්ගතවෙමින් මෙම සේවකයෝ ඉන්නකොට රජය විසින් මේ සියලු ආයතනවල දුක්ගැනිවිලි සලකා බලලා තමයි 6/2006 චක්‍රලේඛය ගෙනාවේ. එම චක්‍රලේඛය ප්‍රකාරව මෙම ආරක්ෂක සේවාවට කිසියම් ශ්‍රේණිගත කිරීමක් ලබා දී තිබෙනවා ද?
පි : ඔව්
ප්‍ර : එතන තමයි මෙම ශ්‍රේණිගත කිරීමේ ආරම්භය කියලා මම යෝජනා කරනවා. එතෙක් තිබිලා නැහැ?
පි : ඔව්

(2023.02.06 දින සාක්ෂි සටහන් පිටු අංක 17,18)

මේ සඳහා 2008 වසරේ සිට ආරම්භ කර 2013 වසරේදී ඒ ඒ තනතුරට අවශ්‍ය සේවක සංඛ්‍යාව හා වැටුප් කේතය තීරණය කිරීමේ ලේඛනයක් පමණක් සාද ා අනුමත කරගත් නමුත් ඒ අනුව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කර ගැනීම ප්‍රමාද වී ඇත. එකී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කර ගැනීම ප්‍රමාද වී ඇත. එකී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සාදා අනුමත කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත්තේ 2018.04.26 දින දී ය. එතෙක් 2001 වසරේ සාදා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත ක්‍රියාත්මක කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් තිබී ඇත.

ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 නිකුත් කරන තුරුම තනතුරු ශ්‍රේණිගත කිරීම පිළිබඳව කටයුතු කර නැති අතර 6/2006 චක්‍රලේඛනයෙන් නියම කර ඇති පරිදි ශ්‍රේණිගත කිරීඹ 2008 වසරේ සිට ක්‍රම ක්‍රමයෙන් 2013 වසර දක්වා නිසි අනුමැතියකින් තොරව ක්‍රියාත්මක වෙමින් පැවතී ඇත.

ප්‍ර : කිසිම තැනක ශ්‍රේණිගත කිරීමක් තිබුනේ නැහැ. ශ්‍රේණිගත කිරීම් ආවේ 6/2006 චක්‍රලේඛනයෙන් කියලා මම යෝජනා කරනවා.
පි : පිළිගන්නවා
ප්‍ර : එසේ නම් 6/2006 චක්‍රලේඛය පැමිණීමට පෙර කිසිදු ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් වීමේ ක්‍රමයක් තිබුනේ නැහැයි කියාල ඔබ පිළිගන්නවා ද?
පි : පිළිතුරු ලබා දීමට හැකියාවක් නැති බව කියා සිටී.
ප්‍ර : ඉන් ගම්‍යවන්නේ අවු 5න් 5ට උසස් වීමේ ක්‍රමයක් හැර ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීමේ ක්‍රමයක් නොතිබුණ බවයි.
පි : නොතිබුණ බව තමයි.

(2023.02.06 දින සාක්ෂි සටහන් පිටු අංක 16,17)

ඒ අනුව පැමිණිලිකරු සේවයට බැඳුන කාලයේ එනම් 1997ට පෙර ආරක්ෂක අංශයේ පැවැති තනතුරු ධූරාවලිය අනුව පැමිණිලිකරුගේ පැමිණිල්ලෙන් කියා සිටින තනතුරු සඳහා උසස් වීම් නොලැබී ඇති බව කියා සිටී. එම තනතුරු 1997ට පෙර පැවැති නමුත් වරින් වර 2006 දක්වා වෙනස්කම් සිදුව ඇති අතර 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය අනුව දැනට පවත්නා ශ්‍රේණිගත කරන ලද තනතුරු ධූරාවලියක් නිර්මාණය වී ඇත.

1997 වර්ෂයට පෙර පැවති තනතුරු නාමයන් අනුව කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරට ඊලඟට ඉහලින් ඇත්තේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරය. ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරට ඊලඟට ඉහලින් ඇත්තේ ස්ථානභාර නිලධාරි ( OIC) තනතුරයි. ස්ථානභාර නිලධාරි තනතුරට ඊලඟට ඉහලින් ඇත්තේ සංචාරක ආරක්ෂක පරීක්ෂක තනතුරය. එම නිසා කණිෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරේ සිට සුදුසුකම් සැපරීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරට උසස්වීමක් ලැබිය හැකිය. එමෙන්ම ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරේ සිට සුදුසුකම් සැපරීමෙන් පසුව ඊලඟ උසස්වීම වන ස්ථානභාර නිලධාරි (OIC) තනතුරට උසස්වීමක් ලැබිය හැකිය. ස්ථානභාර නිලධාරි තනතුරේ සිට සුදුසුකම් සැපරීමෙන් පසුව ඊලඟ උසස් වීම වන සංචාරක ආරක්ෂක පරීක්ෂක (VSO) තනතුරට උසස්වීමක් ලැබිය හැකිය.

2006 වසරින් පසුව තනතුරු ධූරාවලිය අනුව ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි I තනතුරේ සිට සුදුසුකම් සැපිරීමෙන් පසුව ඊලඟ උසස්වීම වන ආරක්ෂක පරීක්ෂක III සඳහා උසස්වීමක් ලැබිය හැකිය. ආරක්ෂක පරීක්ෂක III සිට සුදුසුකම් සැපරීමෙන් පසුව ආරක්ෂක පරීක්ෂක II දක්වා ඊලඟ උසස්වීම ලෙස උසස්වීමක් ලැබිය හැකියි. එපරිදිම ආරක්ෂක පරීක්ෂක I සහ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක II, ජෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක I දක්වා උසස් විය හැකිය.

මේ අනුව පැමිණිලිකරු ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස සුදුසුකම් සැපිරීමෙන් පසුව ස්ථාන භාර නිලධාරි (OIC) ලෙස උසස්වීම් ලැබිය හැකි අතර, 2006 වසරින් පසුව නව තනතුරු නාමයන් අනුව ස්ථානභාර නිලධාරි (OIC) තනතුර සමාන වන්නේ ආරක්ෂක පරීක්ෂක III තනතුරටයි.

ස්ථානභාර නිලධාරි (OIC) තනතුරෙන් පසුව ඊලඟ ඉහල තනතුර වන සංචාරක ආරක්ෂක පරීක්ෂක (VSO) තනතුරට සුදුසුකම් සැපිරීමෙන් පසුව උසස් විය හැකිය. 2006 න් පසුව නව තනතුරු නාමයන් අනුව සංචාරක ආරක්ෂකක පරීක්ෂක (VSO) තනතුර සමාන වනුයේ ආරක්ෂකක පරීක්ෂක II තනතුරටය.

සංචාරක ආරක්ෂක පරීක්ෂක (VSO) තනතුරේ සිට සුදුසුකම් සැපිරීමෙන් පසුව ඊලඟට ඇති නව තනතුරු අනුව උසස් තනතුරකට උසස් විය හැකිය. 2006න් පසුව ඇති කළ නව තනතුරු නාමයන් අනුව ආරක්ෂක පරීක්ෂක I තනතුරට එම නව උසස්වීමේ තනතුර සමානය.

ප්‍ර : 2002.01.01 ට පසුව ඔහුට හිමිවිය යුත්තේ පරණ සේවා ව්‍යවස්ථාව අනුව ස්ථානාධිපති කියන තනතුර නේද?

පි : ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස ශ්‍රේණින් තුනක් පවතිනවා.

ප්‍ර : 2/97 චක්‍රලේඛය අනුව ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරේ III, II, I වශයෙන් තනතුරු ප්‍රදානය කර නැති බවට?

පි : ලේඛන පරීක්ෂාකර බලා පසුව පිළිතුරු ලබාදෙන්නම්.

ප්‍ර : පරණ ව්‍යවස්ථාවට අනුව තුන්වෙනියාට හිමිවිය යුතු තනතුර විසිටින් සිකියුරිටි සුපවරයිසර් කියලා පිලිගන්නවා ද?

පි : ඔව්.

ප්‍ර : මෙම සේවාදායකයාට ස්ථානාධිපති ආරක්ෂක සහ සංචාරක ආරක්ෂක නිලධාරි තනතුරු දෙක ලැබී නැති බව පිළිගන්නවා ද?

පි : ඔව්.

(2023.02.06 සාක්ෂි සටහන් පිටු අංක)

**2. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව මගින් අවුරුදු 5න් 5ට සේවකයින්ට උසස්වීම් ලබාදෙන, බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් ක්‍රියාත්මක වි ඇත් ද ඒ කවදා සිට කවදා දක්වා ද?**

2001 වර්ෂයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් දෙවන පාර්ශ්වය වන වගඋත්තරකාර ආයතනය විසින් පිළියෙල කර ඇති බවත් එම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබානොගෙන ඇති බවත් එසේ වුවත් එහි ඇතැම් කරුණු ක්‍රියාත්මක කර ඇති බව සාක්ෂි මගින් අනාවරණය විය.

විශේෂයෙන් සේවක උසස්වීම් ලබා දීමේදී අවුරුදු 5න් 5ට උසස්වීම් ලබා දීම සඳහා වූ පටිපාටිය 2001 වර්ෂයේ සලකන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව 2001 වර්ෂයේ සිටම ක්‍රියාත්මක කර ඇත. අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන මෙම උසස් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

වැඩ බලන මානව සම්පත් කළමනාකරු සාක්ෂි දෙමින් මෙම තත්ත්වය පිළිගෙන ඇත.

ප්‍ර : සංස්ථාවක ව්‍යවස්ථාපිත ආයතනයක බොහෝ දේවල් කරන්න පුළුවන් අධ්‍යක්ෂක මණ්ඩලයට කියලා ඔබ පිළිගන්නවාද?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව මම යෝජනා කරනවා මේ 5න් 5ට ක්‍රමය 2001 වසරේ සත්‍ය වශයෙන්ම තිබුණා කියලා?

පි : එය අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය අනුව අනුමැතිය අරන් තිබුණ බව පිලිගන්නවා.

(2023.02.06 දින සාක්ෂි සටහන් පිටු අංක 15,16)

කෙසේ නමුත් මෙම ක්‍රමය විධිමත්ව සියලු සේවකයන්ට සාධාරණ වන පරිදි ක්‍රියාත්මක කිරීමට පාලනාධිකාරිය අසමත්ව ඇති බව තහවුරු වේ. විවිධ දේශපාලන බලපෑම් වලට නතුව මෙම උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම නිසා සේවකයින් අසහනයට පත්ව ඇති බව පෙනී යයි. වැඩ බලන මානව සම්පත් කළමනාකරුගේ සාක්ෂි මගින් එම තත්ත්වය පිළිගෙන ඇත.

ප්‍ර : මෙම සේවකයින්ට හිමි විය යුතු කිසිදු තනතුරක් ලබා දී නැහැ. පරණ බඳවා ගැනීමේ පටිපාටියට?

පි : 2008.06.01 දක්වා ලබා නොදී ඇති බවයි පෙනී යන්නේ.

(2023.02.06 දින සාක්ෂි සටහන් පිටු අංක 15,16)

බේරුම්කරු විසින් සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කිරීමේ දී ඔහු තවදුරටත් සාක්ෂි දෙමින් තහවුරු කරන්නේ සමහර සේවකයින්ට මෙම තත්ත්වය නිසා සිදුවූ අසාධාරණය 2008 වසරේ සිට ඉවත් කිරීමට කටයුතු කළ බවකි.

ප්‍ර : කරන ප්‍රකාශය ගැන මම සෑහෙන අප්‍රසාදයකට පත් වෙනවා. මොකද ඔය ආයතනයේම තවත් නඩුවක් මෙහිදී විභාග වෙනවා. ඒ නඩුවේදී ප්‍රකාශ කලේ 2001 සිට මේක (අවුරුදු 5න් 5ට උසස්වීම් ලබාදීම) ක්‍රියාත්මක වෙනවා කියලා. ඔබ කියන්නේ ඒ නඩුවේ එහෙම කියලා තිබෙනවා නම් ඒක වැරදියි කියලද ?

පි : 2001 සිට ක්‍රියාත්මක වුණා. 2001 සිට ක්‍රියාත්මක වන පරිදි බලලා 2008 සිට සාධාරණීකරණය කලා.

6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් වීමෙන් පසුව කාර්ය සාධනය පදනම් කරගත් උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දීමෙන් පසුව 2008 වසරේදී දුක්ගැනිවිලි කමිටුවක් පත්කර 2001 වසරේ සිට 2008 වසර දක්වා උසස්වීම් නොලබා අසාධාරණයට ලක්වූ සේවකයින්ට සාධාරණයක් ඉටු කිරීමට පියවර ගෙන ඇති බව සාක්ෂි දෙමින් වැඩ බලන මානව සම්පත් කළමනාකරු කියා සිටී. තවද දේශපාලන මැදිහත් වීම් නිසා මෙම සේවකයින්ට අසාධාරණයක් වී ඇති බවද වැඩ බලනන මානව සම්පත් කළමනාකරු විසින් පිළිගනී.

ප්‍ර : දේශපාලන මැදිහත් වීමක් හෝ පුද්ගලික හිතවත්කමක් මත උසස්වීම් දීලා තිබෙන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. ඒක පිළිගන්නවා ද?

පි : පිළිගන්නවා.

ප්‍ර : ඒවා මෙම නීති ක්ෂේත්‍රයෙන් (අවුරුදු 5න් 5ට උසස් කිරීමේ ක්‍රමය) පිට බව ඔබ පිළිගන්නවා ද?

පි : පිළිගන්නවා

මේ අනුව වගඋත්තරකාර ආයතනයේ සේවක උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදයක් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සහිතව 2001 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී ඇති බවට තීරණය කරමි.

6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අංක 30 චක්‍රලේඛය සහ අංක 30(1) චක්‍රලේඛ දෙක පරිදි පිළයෙල කරන ලද බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය වගඋත්තරකාර ආයතනය විසින් ප්‍රමාද වී පිළියෙල කිරීම හේතුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත්තේ 2018.04.26 දින දී ය. එබැවින් එය ක්‍රියාත්මක වීම ආරම්භ වී ඇත්තේ ද 2018.04.26 දින සිටය. එම නිසා 2001 වර්ෂයේ සිට 2018.04.26 දින දක්වා වගඋත්තරකාර ආයතනය තුළ ක්‍රියාත්මක වී ඇත්තේ 2001 වර්ෂයේ පිළියෙල කරන ලද අවුරුදු 5න් 5ට උසස් කිරීමේ පටිපාටිය බව තීරණය කරමි. 2018.04.26 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වනුයේ 2018.04.26 දින අනුමැතිය ලැබී ඇති නව බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය වේ.

3. අදාළ ආයතනයේ උසස්වීම් ලබා දීමේ පටිපාටියක් ක්‍රියාත්මක වෙමින් තිබුනේ නම් පළමු පාර්ශ්වය වෙනුවෙන් උසස්වීම් ලබාදීම සාධාරණ ලෙස ක්‍රියාත්මක කර ඇත්ද?

පැමිණිලිකරු 1996.01.28 වැනි දින සිට මාස 06 ක සේවා කාලයක් සඳහා කණිෂ්ඨ ආරක්ෂක නිලධාරියෙකු ලෙස කොන්ත්‍රාත් පදනම මත වගඋත්තරකාර පාර්ශ්වය විසින් සේවයට බඳවාගෙන ඇත. අනතුරුව 1996.07.10 වෙනි දින සිට තවත් මාස 06 ක සේවා කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ සේවය දීර්ඝ කර ඇත. එසේ සේවය දීර්ඝ කර ඇත්තේ 1996.07.10 වැනි දින සිට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරිවරයෙකු වශයෙන් පැමිණිලිකරුගේ තනතුර උසස් කරමිනි. 1997.01.01 දින සිට පැමිණිලිකරුගේ සේවය ස්ථිර කර ඇති අතර තව දුරටත් ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරේම ඔහුව තබා ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97 ට අනුව PL1 වැටුප් කාණ්ඩයේ වැටුප් පරිමාණයක් ඔහුට ලබාදී ඇත.

වැටුප් පරිමාණය : 34140-7 X 720 - 8 X 840 - 45900 (වාර්ෂික)

රුපියල් 3205 ක මාසික වැටුප් තලයේ ඔහුව පිහිටුවා ඇත.

1997 සිට මෙම ආයතනයේ ආරක්ෂක අංශයේ සේවකයින්ගේ තනතුරු නාම භාවිත කර ඇත්තේ ආරක්ෂක සේවා කර්මාන්තයේ පඩිපාලක සභා තීරණ වලට අනුව හඳුන්වා දී ඇති තනතුරුනාම වලට සමානවන ලෙසත් 2001 වර්ෂයේ සිට 2006 දක්වා භාවිතා කර ඇත්තේ 2001 වර්ෂයේ හඳුන්වා දී ඇති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ සඳහන් තනතුරු නාම වලට සමාන වන ලෙසත්ය. නමුත් 1997 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97 ට අනුව වැටුප ලබාදී ඇති බව පෙනේ.

ප්‍ර : එතකොට PL1 ඉන්නකොට තනතුර මොකක්ද?

උ : PL1 ඉන්නකොට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ඊට පස්සේ ඒක සංශෝධනය වුනා 6/2006 දි වැටුප PL2 වුනා

(2023.01.23 දින වැඩ බලන මානව සම්පත් කළමනාකරුගේ සාක්ෂි සටහන් වල 18 වන පිටුව)
නමුත් පළමු පාර්ශ්වය විසින් තමන් වැටුප් ලැබූ 2/97 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ඉදිරිපත් කිරීමට කිසිදු උනන්දුවක් දක්වා නැති අතර පළමු පාර්ශ්වය වෙත අවුරුදු 5 කින් පසුව ලැබිය යුතු OIC (ස්ථානාභාර නිලධාරි) තනතුර 2002.01.01 දිනට ලැබිය යුතු වුවද එම තනතුරට අදාල PL 1. කාණ්ඩයේ වැටුප් පියවර පිළිබඳව කිසිදු විස්තරයක් සාක්ෂි විභාගයේ දී ඉදිරිපත් කර නැත.

2000.08.29 වැනි දින සිදු කරන ලද විෂමාචාර ක්‍රියාවක් හේතුවෙන් 2000.09.05 දින සිට පැමිණිලිකරුගේ වැඩ තහනම් කර ඇත. 2002.01.01 දින සිට සියලු චෝදනා වලින් නිදහස් කර පැමිණිලිකරු ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරේ ම නැවත සේවයේ පිහිටුවා ඇත.

මෙම වැඩ තහනම් කිරීමේ දී පළමු පාර්ශවකරු වෙත චෝදනා පත්‍රයක් ලබාදී ඇතත් ඔහුට තමනිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදී නැත. ඒක පාර්ශවිකව විමර්ශනයක් කර ඔහු වැරදිකරු බවට තීරණය කරමින් දඩුවමක් ලෙස හිඟ වැටුප් රහිතව

2002.01.01 දින නැවත සේවයේ පිහිටුවා ඇත. නමුත් පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිසම වෙත කරන ලද පැමිණිල්ලට අනුව දෙපාර්ශ්වය විසින් එහි දී සමථයකට පත්වී ඇත. දෙවන පාර්ශ්වය විසින් 2004.05.25 දිනැති ලිපිය මගින් පළමු පාර්ශ්වයට එරෙහි සියලු චෝදනා ඉවත් කරගෙන ඇත. පළමු පාර්ශ්වයට සියලු හිඟ වැටුප් ද ගෙවා ඇත.

ඒ අනුව පළමු පාර්ශ්වයට ලබා දිය යුතු උසස්වීම් සම්බන්ධයෙන් මෙම වැඩ තහනම් කිරීම මගින් කිසිදු බල පෑමක් සිදු නොකරන බව පැහැදිලි ය. ඒ බැව් වැඩ බලන මානව සම්පත් කළමනාකරුගේ සාක්ෂි මගින් තහවුරු වේ.

ප්‍ර : පැහැදිලි කරන්න අධිකරණයට ඉල්ලුම්කරුගේ 2001 කාලයට අදාළ සේවා තහනම ඉල්ලුම්කරුට හිමි උසස් වීම් වලට අහිතකර ලෙස බලපාලා තිබෙනවා ද?

පි : නැහැ

(2023.02.06 සාක්ෂි සටහන්වල 6 වන පිටුව)

1996.01.28 දින සිට 1997.01.01 දින දක්වා පළමු පාර්ශ්වය කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති අතර 1997.01.01 දින ස්ථිර පදනම යටතේ ඔහු දරමින් සිටි තනතුරට ම නැවත පත්වීම ලබාදෙන ලදී. කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කල කාලය ද උසස්වීම් සඳහා සළකා බැලෙන සේවා කාලයට අන්තර්ගත වන බව වැඩ බලන මානව සම්පත් කළමනාකරු විසින් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

ප්‍ර : ආයතනයේ අවුරුදු 5න් 5 ට උසස්වීම් දෙන පිළිවෙතක් තිබෙනවා නේද?

පි : ඔව්.

ප්‍ර : එම පත්වීම් අවුරුදු 5 න් 5 ට ලබාදෙන කොට අර කොන්ත්‍රාත් පදනම මත හිටපු සේවා කාලයත් ඒ අවුරුදු 5 ට ගැනෙනවාද?

පි : ගැනෙනවා.

(2023.01.23 සාක්ෂි සටහන් පිටු අංක 12)

එසේ නමුත් 1996.07.10 දින සිට කුමන හේතුවක් නිසා හෝ පැමිණිලිකරුට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරිවරයෙකු ලෙස උසස්වීමක් ලැබී ඇත. ඒ අනුව පැමිණිලිකරුට මීළඟ උසස්වීම ලැබිය යුත්තේ අවුරුදු 5 ක සේවා කාලයකින් පසුව 2001.07.10 දිනට වේ. නමුත් අවුරුදු 5 න් 5 ට උසස්වීම් ලබාදීමේ ක්‍රමය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2001 වර්ෂයේ දී අනුමත කර ක්‍රියාත්මක කරන ලද බව දෙපාර්ශ්වයේම සාක්ෂි මගින් ප්‍රකාශ වුවද 2001 වර්ෂයේ කුමන මාසයක කුමන දිනක සිට ක්‍රියාත්මක වී ද යන්න අනාවරණය වී නැත.

එම නිසා මීළඟ උසස්වීම 2001 වර්ෂයෙන් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු බවට නිගමනය කිරීම සාධාරණ සහ යුක්ති සහගත වේ. පැමිණිලිකරුගේ සේවය කොන්ත්‍රාත් පදනමේ සිට ස්ථිර පදනමට පත්කර ඇත්තේ 1997.01.01 දින දී නිසාත් එදින සිට අවුරුදු 5 ක සේවා කාලය සම්පූර්ණ වනුයේ 2001 වර්ෂයට පසු දිනක් වන 2002.01.01 නිසාත් මීලඟ උසස් වීම 2002.01.01 දිනට ලැබිය යුතු බව තීරණය කිරීම වඩාත් සාධාරණ සහ යුක්ති සහගත වේ.

පළමු පාර්ශ්වයට එරෙහිව පැවැති විනය පරීක්ෂණය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂමේ පැවැති පැමිණිලි විභාගය අවසන් වීමෙන් පසුව දෙවන පාර්ශ්වය විසින් පැමිණිලිකරුට එරෙහිව නගා ඇති සියලු චෝදනා ඉවත් කරගෙන ඇත්තේ සාමාන්‍යාධිකාරිවරයාගේ 2004.05.25 දිනැති ලිපිය මගිනි. ඒ අනුව පැමිණිලිකරුට 2002.01.01 දිනට ලැබිය යුතු උසස්වීම 2004.05.25 දිනෙන් පසුව වුව ද ලබාදීමේ දී 2002.01.01 දිනට පෙරදාතම කර එය ලබාදීමට දෙවන පාර්ශ්වයට හැකියාව තිබුණද ඔවුන් එය ඉටුකර නැත.

2002.01.01 දිනට පැමිණිලිකරුට ලබාදිය යුතු උසස්වීම වනුයේ OIC හෙවත් ස්ථානභාර නිලධාරි තනතුරට උසස් කිරීම විය යුතුය. එම උසස් වීම ලබානොදීම පළමු පාර්ශ්වයට සිදුවී ඇති අසාධාරණයකි. ස්ථානභාර නිලධාරියාට (OIC) ලෙස උසස්වීම ලබා දුන්නේ නම් ඔහු තැබිය යුතු වැටුප් පියවර පිළිබඳ පළමු පාර්ශ්වය හෝ දෙවන පාර්ශ්වය විසින් කිසිදු කරුණු දැක්වීමක් කර නැති අතර ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමක් ද කර නැත.

පැමිණිලිකරු තවදුරටත් 1997.01.01 දින සිට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරිවරයෙකු වශයෙන් 2004 වර්ෂය වන විටත් සේවය කර ඇති අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2004 යටතේ වැටුප් සංශෝධනයක් සිදුකර 2005.10.01 දිනට මාසික වැටුප රු.8140.00 ක වැටුප් පියවරේ තබා ඇත.

වැටුප් පරිමාණය : 97680 - 10 X 960 - 8 X 1320 - 117840 (වාර්ෂික)

2002.01.01 දිනට ලැබිය යුතුව තිබූ උසස් වීමෙන් පසුව සේවා කාලය අවුරුදු 05 ක් ඉක්මවායාමෙන් පසුව එළඹෙන 2007.01.01 දිනට මීලඟ උසස්වීම ලැබිය යුතුව තිබුණි. ඒ අතර 2006.04.25 දිනැති 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ නියම කරන ලද වැටුප් ප්‍රතිශෝධනය රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ට ආදළ වන පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද 2006.09.22 දිනැති චක්‍රලේඛ අංක : 30 හා 2009.06.01 දිනැති චක්‍රලේඛ අංක 30(1) මගින් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලැබී ඇත.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 අනුව සේවක මණ්ඩලය නැවත කාණ්ඩ ගත කිරීම හා ශ්‍රේණිගත කිරීම කළ යුතුව ඇත. එම කාණ්ඩ ගත කිරීම හා ශ්‍රේණිගත කිරීම ද සේවක සංඛ්‍යා තීරණය කිරීමද අදාළ වැටුප් කේත ලබාදීම ද සඳහා වූ ලේඛනය පළමුව පිළියෙල කළ යුතු අතර බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය පිළියෙල කිරීම දෙවනුව කළ යුතුව ඇත. ඒ අනුව කාණ්ඩගත කිරීම හා ශ්‍රේණිගත කිරීම ඇතුළු සේවක සංඛ්‍යා තීරණය කිරීමේ ලේඛනය සැකසීම 2008 වර්ෂයේ සිට මන්දගාමීව සිදුකර 2013.01.17 දින දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇත.

ඊට අනුරූපව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කර ඇත්තේ 2018.04.26 දින දී ය. එනම් එම කටයුත්ත ද ඉතා ප්‍රමාද වී සිදුකර ඇත.

සේවක මණ්ඩල කාණ්ඩ ගත කිරීම හා ශ්‍රේණිගත කිරීම 2008 වර්ෂයේ සිට ආරම්භ කළ ද එම කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීමට ප්‍රථම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට පෙර අවිධිමත් ලෙස එය ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරා ඇත. ඒ සඳහා වගඋත්තරකාර ආයතනය විසින් 2008 වර්ෂයේ දී සේවක දුක්ගැනවිලි කමිටුවක් පත්කර ශ්‍රේණි උසස්වීම් කිරීමට පියවර ගෙන ඇත.

පැමිණිලිකරුට 2007.01.01 දිනට ලැබිය යුතු උසස්වීම වෙනුවෙන් සංචාරක ආරක්ෂක පරීක්ෂක (vso) තනතුර ලබා දිය යුතු වුවත් වගඋත්තරකාර ආයතනය විසින් එම උසස්වීම ලබාදීම ද පැහැර හැර ඇති අතර ඉහත සඳහන් 2008 වර්ෂයේ දී පත් කරන ලද දුක්ගැනවිලි කමිටුවේ නිර්දේශ මත 2008.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආරක්ෂක පරීක්ෂක තනතුරට උසස්වීමක් 2008.08.03 දිනැති ලිපිය මගින් පෙරදාතම කර ලබාදී ඇත. එම ලිපියේ අදාළ ශ්‍රේණියක් සඳහන් කර නොතිබූ අතර පසුව 2008.10.06 දිනැති ලිපිය මගින් තනතුරේ ශ්‍රේණිය සඳහන් කරමින් ආරක්ෂක පරීක්ෂක iii ලෙස උසස් කරන ලද තනතුර සංශෝධනය කර ඇත.

පිහිටුවා ඇති වැටුප් කාණ්ඩය PL 2 - 2006 වන අතර ආරම්භක වැටුප් පියවර මසකට රු. 15870 ක් විය.

වැටුප් පරිමාණය : 12140 - 10 X 110 - 10 X 120 - 10 X 130 - 12 X 140 - 17280

නැවත 2008.07.01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව වැටුප පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

වැටුප් කාණ්ඩය : MA 1-2 2006

ආරම්භක වැටුප් පියවර : රු 16080/. (මාසික)

වැටුප් පරිමාණය : 13320 - 10 X 120 - 7 X 140 - 12 X 290 - 12 X 315 - 22760

කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 (1) අනුව නැවත 2009.07.01 දින සිට පහත සඳහන් පරිදි නැවත වැටුප් සංශෝධනයක් කර ඇත.

වැටුප් කාණ්ඩය : MA 1-2-2006 A

ආරම්භක වැටුප් පියවර : රු 16090/- (මාසික)

වැටුප් පරිමාණය 13320 - 10 x 120 - 7 x 140 - 12 x 290 - 12 x 315 - 22760

ආරක්ෂක පරීක්ෂක iii යනු පැරණි තනතුරු නාමයන්ට අනුව ස්ථානභාර නිලධාරි (OIC) තනතුරය. එසේ හෙයින් මෙම තනතුර පැමිණිලිකරුට ලබාදිය යුතුව තිබුනේ 2002.01.01 දිනයේදී ය වගඋත්තරකාර ආයතනය කිසිදු හේතු දැක්වීමකින් තොරව එය පැහැර හැර ඇත.

එමෙන්ම 2002.01.01 සිට අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ වන දිනය වන 2007.01.01 දිනට පැමිණිලිකරුට ලැබිය යුතුව තිබූ ඊලඟ උසස්වීම වන සංචාරක ආරක්ෂක පරීක්ෂක (vso) තනතුර ද ඔහුට ලබාදීම වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් අසාධාරණ ලෙස කිසිදු හේතු දැක්වීමකින් තොරව පැහැර හැර ඇත. 2006 වර්ෂයෙන් පසුව ඇති කරන ලද නනතුරු නාමයන් අනුව සංචාරක ආරක්ෂක (vso) යනු ආරක්ෂක පරීක්ෂක ii ශ්‍රේණිය වේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමට ප්‍රථම වගඋත්තරකාර ආයතනය විසින් සේවක දුක්ගැනවිලි කමිටුවක් පත්කර එහි නිර්දේශමත ශ්‍රේණි උසස්වීම් කර ඇති බව වැඩ බලන මානව සම්පත් කළමනාකරු විසින් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

ප්‍ර : 2008.06.01 දින ආරක්ෂක පරීක්ෂක iii ලබාදී ඇති බව පිළිගන්නවාද?

උ : ඔව්

ප්‍ර : එසේ නම් මෙම තනතුර නිර්මාණය වුනේ කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් නොවේ කියලා යෝජනා කරනවා?

උ : ආයතන මට්ටමින් බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කරමින් ගියා. ඒ අනුව තමයි දුක් ගැනවිලි කමිටුවක් මගින් ආරක්ෂක පරීක්ෂක iii ශ්‍රේණිය ලබා දුන්නේ. එය (සේවක කාණ්ඩ ශ්‍රේණිගත කිරීම හා සේවක සංඛ්‍යා ලේඛනය) අමාත්‍යංශ මට්ටමින් යෝජනා වෙලා සංස්ථාපනය වෙලා 2013 වසරේ දී තමයි කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් ආයතනයට ලැබුනේ. කෙටුම්පත් කරන කාලසීමාව තුළ මේ කියන තනතුර ස්ථාපිත කරලා යෝජනා කරලා එම කාලයේ දී නමයි දුක් ගැනවිලි කමිටුවක් නිර්මාණය වුනේ. එතන දී තමයි එම තනතුරු ලබාදීමට කටයුතු කළේ

(2023.03.10 වැඩ බලන මානව සම්පත් කළමනාකරුගේ සාක්ෂි සටහන් පිටු අංක 6, 7)

2007.01.01 දිනයෙන් පසුව සම්පූර්ණ කරන ලද අවුරුදු 5 ක සේවා කාලය අවසන් වන 2012.01.01 දිනට පැමිණිලිකරු වෙත ලැබිය යුතු තනතුර එවකට පැවැති තනතුරු නාමයන්ට අනුව ආරක්ෂක පරීක්ෂක i ශ්‍රේණියේ තනතුරකි. එම උසස්වීම ලබාදීම ද වගඋත්තරකාර ආයතනය විසින් පැහැර හැර ඇත.

ඒ වෙනුවට පැමිණිලිකරුට 1997.01.01 දිනයෙන් පසුව 2008.06.01 දිනට ලැබුණ පළමු උසස්වීම වන ආරක්ෂක පරීක්ෂක iii තනතුරෙන් පසු අවුරුදු 5 ක සේවාකාලයක් සම්පූර්ණ වන 2013.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආරක්ෂක පරීක්ෂක ii ශ්‍රේණියේ තනතුරකට පත් කර ඇත.

ඊට පෙර ආරක්ෂක පරීක්ෂක iii ශ්‍රේණියට අදාළ වැටුප 2012.11.01 දින සිට අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් පරිදි සංශෝධනය කරන ලදි.
වැටුප් කාණ්ඩය : J M 1 - 2 - 2006

තබන ලද වැටුප් පියවර : රු. 20525/- (මාසිකව)

වැටුප් පරිමානය : 20525 - 10 x 365 - 18 x 550 - 34075

පසුව 2013.06.01 දින සිට ආරක්ෂක පරීක්ෂක ii ශ්‍රේණියට උසස් කිරීමේ දී තබන ලද වැටුප් පියවර පිළිබඳ විස්තර:

වැටුප් කාණ්ඩය : J M 1 - 2 - 2006 A

තබන ලද වැටුප් පියවර : රු. 22350/- (මාසිකව) එනම් වැටුප් වර්ධක 5ක් ඉදිරියෙන් වූ වැටුප් තලයක් ලබාදී ඇත.

වගඋත්තරකාර ආයතනය විසින් 1997.01.01 දිනට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස ස්ථිර පත්වීමක් ද 2008.06.01 දිනට ආරක්ෂක පරීක්ෂක iii තනතුර ද 2013.06.01 දින ආරක්ෂක පරීක්ෂක ii තනතුර ද ලබාදී ඇත.

2013.06.01 දින සිට අවුරුදු 5ක සේවා කාලයක් සම්පූර්ණ වන 2018.06.01 දිනට මීළඟ උසස්වීම වන ආරක්ෂක පරීක්ෂක I තනතුර ලැබිය යුතු වුවද 2018.04.26 දින සිට ක්‍රියාත්මක කරන ලද නව සේවක බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටියට අනුව එය කළ නොහැකි බව වගඋත්තරකාර පාර්ශ්වය කියා සිටී.

ඊට හේතුව නව බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටියට අනුව යම් තනතුරක සිට ඊළඟ තනතුරට උසස්වීමක් ලබා ගැනීම සඳහා පෙර තනතුරට පත්වීම ලද දින සිට අවුරුදු 10ක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුව තිබීමයි.

නමුත් පැමිණිලිකරු 2019.11.06 දින විශ්‍රාම ලබා ඇත.

ඒ නමුත් විය යුතුව තිබුනේ පැමිණිලිකරුගේ මුල් ස්ථිර පත්වීම වූ 1997.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාගත් ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී තනතුරේ සිට අවුරුදු 5ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය වූ 2002.01.01 දිනට ස්ථානභාර නිලධාරී (OIC) තනතුර ද ඊලග අවුරුදු 5 සම්පූර්ණ කිරීමෙන් පසුව සංචාරක ආරක්ෂක පරීක්ෂක (vso) තනතුරද තවත් අවුරුදු 5කින් ආරක්ෂක පරීක්ෂක තනතුර ද ඊලග අවුරුදු 5 අවසානයේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක තනතුර ද ලැබීමයි.

i. ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස 1997. 01.01 දින සිට ස්ථිර පත්වීම ලැබීමේ දී ඊට අදාළ වැටුප් විස්තර:
   වැටුප් කාණ්ඩය : PLI (2/97 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය අනුව)
   වැටුප් පියවර : රු. 2845/- (මාසික)
   වැටුප් පරිමාණය : 34140 - 7 x 720 - 8 x 840 - 45900 (මාසික)
ii. ස්ථානභාර නිලධාරි (OIC) ලෙස 2002.01.01 දිනට ලැබිය යුතුව තිබූ උසස් වීම අනුව එම තනතුරට අදාළ වැටුප් විස්තර :
   - දෙපාර්ශ්වය විසින්ම ලබාදී නැත -
iii. සංචාරක ආරක්ෂක පරීක්ෂක (vso) ලෙස 2007.01.01 දිනට ලැබිය යුතුව තිබූ උසස්වීමට අදාළ වැටුප් විස්තර : 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුර 2006.01.01 ට පසුව ඇති කළ නව තනතුරු නාම අනුගමනය කරමින් ආරක්ෂක පරීක්ෂක ii ලෙස නම් කළ හැකිය. නමුත් එම චක්‍රලේඛනයට අනුව වැටුප් සංශෝධනය කර ඇත්තේ 2008.01.01 දින සිටය. 2007 වර්ෂයේ මෙම තනතුරට අදාළ වැටුප් පිළිබඳ ලේඛන විස්තර දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කර නැත.
iv. ආරක්ෂක පරීක්ෂක I ලෙස 2012.01.01 දිනට ලැබිය යුතුව තිබූ උසස්වීමට අදාළ වැටුප් විස්තර දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කර නැත.
v. 2012.01.01 දින සිට වසර 5ක සේවා කාලය සම්පූර්ණ වන 2017.01.01 දිනට පැමිණිලිකරුගේ ඊළඟ උසස්වීම ලැබිය යුතුව ඇත. එනම් ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණියේ තනතුරු ලැබිය යුතුව ඇත.
   ඊට අදාළ වැටුප් විස්තර :
   දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි විභාගයේ දී ඉදිරිපත් කර නැත.

2/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2016.01.01 දින සිට වැටුප් සංශෝධනයක් සිදුව ඇති අතර ඒ අනුව ආරක්ෂක පරීක්ෂක II තනතුරේ වැටුප තීරණය කර ඇත. රාජ්‍ය පරිපාලන 2/2016 මගින් ඉදිරිපත් කර ඇති නව වැටුප් තීරණය කිරීම සඳහා පහසු වන පරිදි සකස් කර ඇති වැටුප් පරිවර්තන වගු ලේඛනය ඇමුණුමක් ලෙස මීට යා කර ඇත. (ඇමුණුම III)

2001 වර්ෂයේ සිට 2018.04.26 දින දක්වා වගඋත්තරකාර ආයතනය පරිචයක් ලෙස අනුගමනය කරමින් පැවැති අවුරුදු 5 න් 5ට උසස්වීමේ පටිපාටිය අනුව පැමිණිලිකරුට ලැබිය යුතු උසස් වීම් සහ ඒ වෙනුවට සත්‍ය වශයෙන්ම ලැබී ඇති උසස්වීම් පහත සටහන මගින් පැහැදිලි කර ඇත.

| *උසස්වීම් ලැබී ඇති දිනය* | *සාධාරණ ලෙස සහ නියමිත දිනයට පැමිණිලිකරුට ලැබිය යුතු උසස්වීමට අදාළ තනතුර* | *පැමිණිලිකරුට සත්‍ය ලෙසම ලැබී ඇති උසස්වීම් වලට අදාළ තනතුරු* |
|---|---|---|
| 2002.01.01 | ස්ථාන භාර නිලධාරි (OIC) | |
| 2007.01.01 | සංචාරක ආරක්ෂක පරීක්ෂක (VSO) | |
| 2008.06.01 | - | ආරක්ෂක පරීක්ෂක III |
| 2012.01.01 | ආරක්ෂක පරීක්ෂක I | |
| 2013.06.01 | - | ආරක්ෂක පරීක්ෂක II |
| 2017.01.01 | ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක II | |

**04. එසේ සාධාරණ ලෙස දෙවන පාර්ශ්වය විසින් කටයුතු කර නොමැති නම් පළමු පාර්ශ්වය වෙත ලබාදිය හැකි සහනයන් කවරේද යන්න තීරණය කිරීම.**

බේරුම්කරණ ක්‍රියාවලියේ දී ඉදිරිපත් වූ ලිඛිත හා වාචික සාක්ෂි පදනම් කර ගනිමින් එම සාක්ෂි මනාව විශ්ලේශනය කිරීමේ දී පැමිණිලිකාර පළමු පාර්ශ්වය වෙත පහත සඳහන් අසාධාරණයන් සිදුව ඇති බව නිගමනය කරමි.

i. ආයතනයේ ක්‍රියාත්මක වෙමින් පැවති අවුරුදු 5න් 5ට උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදය සාධාරණ ලෙස ආයතනයේ සේවය කරන සමස්ථ සේවකයින් වෙනුවෙන් ක්‍රියාත්මක වී නැති අතර විවිධ බලපෑම් හා හිතවත්කම් මත එම උසස්වීම් ලබාදීම නිසා පැමිණිලිකරුට බලවත් අසාධාරණයක් සිදුව ඇත. ඒ නිසාම පැමිණිලිකරුට 2002.01.01 දිනට ලැබිය යුතුව තිබූ උසස් වීම වන ස්ථානාධිපති (OIC) තනතුරට උසස්වීමක් ලැබී නැත.

ii. 2007.01.01 දිනට ලැබිය යුතුව තිබූ උසස්වීම වන සංචාරක ආරක්ෂක පරීක්ෂක (VSO) තනතුරට උසස්වීමක් ද ලැබී නැත.

iii. 2012.01.01 දිනට ලැබිය යුතුව තිබූ උසස්වීම වන ආරක්ෂක පරීක්ෂක I තනතුරට උසස් වීමක් ද ලැබී නැත.

iv. 2017.01.01 දිනට ලැබිය යුතුව තිබූ අවසාන උසස්වීම වන ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක II තනතුරට උසස්වීමක් ලැබී නැත.

නමුත් 2002.01.01 දිනට ලැබිය යුතුව තිබූ ස්ථාන භාර නිලධාරි තනතුර, 2007.01.01 දිනට ලැබිය යුතුව තිබූ සංචාරක ආරක්ෂක පරීක්ෂක තනතුර, 2012.01.01 දිනට ලැබිය යුතුව තිබූ ආරක්ෂක පරීක්ෂක I තනතුර 2017.01.01 දිනට ලැබිය යුතුව තිබූ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක II තනතුර යන තනතුරු හතරේම වැටුප් විස්තර එනම් වැටුප් කාණ්ඩය වැටුප් පරිමාණය හා වැටුප් පියවර පිළිබඳ විස්තර ප්‍රමාණවත් ලෙස දෙපාර්ශ්වයම විසින් සාක්ෂි විභාගයේදී ලබාදීමට අසමත්ව ඇත.
මේ නිසා පැමිණිලිකරු සත්‍ය වශයෙන්ම දරමින් සිටි තනතුර වෙනුවෙන් ලැබූ වැටුපත් ඔහුට ලැබීමට නියමිතව තිබුණද නොලැබී ගිය තනතුරේ වැටුපත් අතර වෙනස ගණනය කර පැමිණිලිකරුට මූල්‍ය ප්‍රදානයක් වශයෙන් ගෙවීම තීරණය කිරීමට නොහැකිව ඇත.
ඊට විකල්පයක් වශයෙන් පහත සඳහන් පරිදි ගණනය කරනු ලබන මූල්‍යමය ප්‍රදානයක් පැමිණිලිකරු වෙත ගෙවීමට තීරණය කිරීම සාධාරණ සහ යුක්ති සහගත වනු ඇත.

මගේ නිරීක්ෂණයන් අනුව මෙම ආයතනයේ එකම වැටුප් පරිමාණයක වෙනස් වැටුප් පියවර දෙකක තබා ඇති අනුයාත තනතුරු දෙකක් අතර වැටුපේ වෙනස වැටුප් වර්ධක 4 කට හෝ 5ට වඩා වැඩි නොවේ. නමුත් එකම වැටුප් පරිමාණයේ වැටුප් නොලබන වෙනස් වැටුප් පරිමාණයන් දෙකකට අනුව වැටුප් ලබන අනුයාත තනතුරු දෙකක් අතර වැටුපේ වෙනස වැටුප් වර්ධක 5ක් මෙන් දෙගුණයක් පමණ එනම් වැටුප් වර්ධක 10ක් පමණ වනු ඇත.

ඒ අනුව ලැබීමට නියමිත ව තිබුණ ද පැමිණිලිකරු හට නොලැබී ගිය තනතුරකට අනුයාත පහල තනතුරක් සත්‍ය වශයෙන්ම පැමිණිලිකරු විසින් දරමින් සිටි අවස්ථාවක සහ එම තනතුරු දෙකම එකම වැටුප් පරිමාණයේ වෙනස් වැටුප් පියවර දෙකක ඇති වැටුප් වලට හිමිකම් දරන අවස්ථාවක පැමිණිලිකරු විසින් දරමින් සිටින තනතුරේ ඉදිරියට ඊළඟ ට ඇති මාසික වැටුප් වර්ධක 5 කට සමාන වූ මුදලක් සෑම මාසයක් වෙනුවෙන්ම ගණනය කර පැමණිලිකරුට වගඋත්තරකාර ආයතනය විසින් ප්‍රදානයක් වශයෙන් ගෙවීම සාධාරණ සහ යුක්ති සහගත බව තීරණය කරමි.

තවද ලැබිය යුතු තනතුරට වඩා තනතුරු 2 ක් පහළින් පැමිණිලිකරු විසින් තනතුරක් දරමින් සිටයේ නම් පැමිණිලිකරුට ගෙවීම සඳහා ඉහතින් ගණනය කරන ලද ක්‍රමයට අදාළ මාසික වැටුප් වර්ධක 5 වෙනුවට මාසික වැටුප් වර්ධක 10ක් එනම් වැටුප් වර්ධක දෙගුණයක අගය පැමිණිලිකරුට ගෙවීම් සඳහා ගණනය කළ යුතු බවට තීරණය කිරීම සාධාරණ වනු ඇත.

වගඋත්තරකාර ආයතනය විසින් කිසියම් අවස්ථාවක ආරක්ෂක සේවයේ වැටුප් සංශෝධනය කිරීම සඳහා සේවකයින් ලබමින් සිටින වැටුප් ඇතුලත් වැටුප් පරිමාණය වෙනස් කරමින් ඉහල වැටුප් පරිමාණයක් හඳුන්වා දීමේ දී පැමිණිලිකරුට ගෙවීම සඳහා ඉදිරි මාසික වැටුප් වර්ධක 5 ක අගය ගණනය කිරීමේ දී එම මාසික වැටුප් වර්ධක 5 මෙන් දෙගුණයක වැටුප් වර්ධක ප්‍රමාණයක් එම ගණනය කිරීම සඳහා යොදගත යුතු බවට ද තීරණය කරන අතර එම තීරණය සාධාරණ තීරණයක් වනු ඇත.

මෙම ගණනය කිරීම් සඳහා භාවිතා කරන ලද ලේඛන (i,ii,iii) යොදගන්නා ලදි.

i. පැමිණිලිකරු විසින් 1997.01.01 සිට 2019.11.06 දින දක්වා ලබා ඇති මාසික වැටුප් අදාළ වැටුප් පරිමාණ, ලබා ඇති උසස්වීම් සහ වැටුප් කේතයන් සඳහන් ලේඛනය.
ii. පැමිණිලිකරුට නොලැබී ගිය උසස්වීම් වෙනුවෙන් අමතර වැටුප් වර්ධක ලබා දෙමින් ගණනය කරන ලද මූල්‍ය ප්‍රදානයට අදාළ ලේඛනයි.
iii. 2/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති පැමිණිලිකරුගේ වැටුපට අදාළ වැටුප් පරිවර්තන වගුව.

**ප්‍රදනය**

i. ලංකා ධීවරවරාය නීතිගත සංස්ථාවේ සේවක තනතුරු නාමයන් වරින් වර වෙනස් වී ඇති නමුත් පැමිණිලිකරු සේවයට බැඳුන මුල් කාලයේදී ඔහුගේ පැමිණිල්ලේ සඳහන් කරන ලද තනතුරු නාමයන් වන OIC, CSO, A/D, S/D යන තනතුරු පැවති ඇති බවට තීරණය කරමි. ඒ අනුව අයි. ඩී. එස්. සමරනායක මහතාට 2002.01.01 දිනට OIC හෙවත් ස්ථාන භාර නිලධාරි තනතුරද 2007.01.01 දිනට VSO හෙවත් සංචාරක ආරක්ෂක පරීක්ෂක නිලධාරි තනතුර ද 2012.01.01 දිනට ආරක්ෂක පරීක්ෂක I තනතුර ද 2017.01.01 දිනට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක II තනතුර ද හිමි බවට තීණය කරමි. නමුත් එම තනතුරු නියමිත දිනට ලබා නොදීම සහ සමහර තනතුරු ඔහු සේවයෙන් විශ්‍රාම ලබාගන්නාතුරුම ලබා නොදීමෙන් බරපතල අසාධාරණයක් ඔහුට සිදුව ඇත.

ii. ඉහත සඳහන් පරිදි අයි. ඩී. එස්. සමරනායක මහතාට ලැබීමට හිමිකම තිබූ උසස්වීම් ලංකා ධීවරවරාය නීතිගත සංස්ථාව විසින් ලබානොදීමෙන් ඔහුට සිදුව ඇති මූල්‍යමය හානිය වෙනුවෙන් පහත සඳහන් පරිදි මූල්‍යමය ප්‍රදානයක් නියමකරන අතර ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් එම මුදල අයි. ඩී. එස්. සමරනායක මහතා වෙත ගෙවීම සඳහා 2023 අගෝස්තු මස 10 වන දින හෝ එදිනට පෙර උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය.

| | |
|---|---|
| a) අයි. ඩී. එස්. සමරනායක මහතාට නොලැබී ගිය උසස්වීම් වෙනුවෙන් අමතර වැටුප් වර්ධක ලබා දෙමින් ගණනය කරන ලද මූල්‍ය ප්‍රදානය. | රු. 970770.00 |
| b) අහිමිව ගිය සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් වෙනුවෙන් සේව්‍යයා විසින් ගෙවිය යුතු 12% ක ප්‍රමාණය වෙනුවෙන් සලකා බලා ඉහත මූල්‍ය ප්‍රදානයෙන් 12% ක මුදලක් ද මූල්‍ය ප්‍රදානයට එකතු කරනු ඇත. | රු. 116492.40 |
| c) අහිමිව ගිය සේවකභාර අරමුදලේ දායක මුදල් වෙනුවෙන් සේව්‍යා විසින් ගෙවිය යුතු 3% ක ප්‍රමාණය වෙනුවෙන් සලකා බලා ඉහත මූල්‍ය ප්‍රදානයෙන් 3% ක මුදලක් ද මූල්‍ය ප්‍රදානයට එකතු කරනු ඇත. | රු. 29123.10 |
| එකතුව (සම්පූර්ණ මූල්‍ය ප්‍රදානය) | රු. 1,116,385.50 |

බේරුම්කරු - එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක

2023 ජුනි මස 07 දින දී ය.

- පසුව සටහන් තබමි.

2023.05.29 දින පළමු පාර්ශ්වය විසින් තමන් විසින් 2023.04.19 දින ඉදිරිපත් කර ඇති ලිඛිත සැලකිරීමට අමතර වශයෙන් වූ ලේඛන කිහිපයක් ඉදිරිපත් කර ඇති අතර එම ලේඛන සාක්ෂි විභායයේ දී ලකුණු නොකරන ලද ලේඛන වේ. එබැවින් එම ලේඛන සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයට කරුණු දැක්වීමට අවස්ථාවක් ලැබී නැති බැවින් එම ලේඛන සියල්ලම නිසි ලෙස සැළකිල්ලට භාජනය කිරීමට නොහැකි විය. එමෙන්ම මෙම ප්‍රදනය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට සහතික කරමි.

බේරුම්කරු

2023 ජූනි මස, 07 වැනි දින

EOG 08 - 0076

මගේ අංකය: IR/COM/01/2020/81.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.03.27 දිනැති හා අංක 2325/02 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.03.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 216, 04 වන මහල, " මඟ නැගුම මහ මැදුර " මාර්ග සංවර්ධන අධිකාරිය, ඉඩම් අංශය හි පිහිටි ඉඩම, සමාජ හා පරිසර කටයුතු පිළිබඳ ඒකාබද්ධ වෘත්තීකයන්ගේ සංගමය සහ කොස්වත්ත, බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 216, මඟ නැගුම මහ මැදුර හි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.07.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

ඉඩම් සමාජ හා පරිසර කටයුතු පිළිබඳ
ඒකාබද්ධ වෘත්තිකයන්ගේ සංගමය,
ඉඩම් අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය,
" මග නැගුම මහමැදුර " . 04 වන මහල,
අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

*පැමිණිලිකරු*

නඩු අංකය: A /36/ 2023
1R /COM/01/2020/81

එදිරිව

මාර්ග සංවර්ධන අධිකාරිය,
මග නැගුම මහා මැදුර,
අංක. 216,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

*වගඋත්තරකරු*

අතර පවතින කාර්මික ආරාවුල

බේරුම්කරණ තීන්දු ප්‍රකාශය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

" 2009 වර්ෂයෙන් පසු උපාධිධාරීන් බඳවා ගැනීමේදි සහ ශ්‍රේණි උසස්වීම් ලබා දීමේදි 2005 වර්ෂයේ බඳවා ගනු ලැබූ උපාධිධාරීන් හට වර්ෂ 08 ක සේවා පළපුරුද්දෙන් පසුව ලබා දී ඇති JM -1-1 (grade 1) ශ්‍රේණි උසස්වීම් 2009 වර්ෂයෙන් පසු බඳවා ගත් පහත සඳහන් උපාධිධාරීන් හට ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද, යන්නත් පිළිබඳ වේ".

එම හිමිකම් ඉල්ලා සිටින සේවක පිරිස පහත වේ.

01. ජේ.එම්.එස්.සී.ජයවර්ධන
02. වී.ඒකනායක
03. සී.ඩබ්.එස්.ප්‍රනාන්දු
04. කේ.ඒ.සී.ආර්.පෙරේරා
05. ඩබ්.ඒ.ඒ.එන්.විජේසිංහ
06. පී.ඒ.පී.කුමාර
07. ඊ.එම්.සී.එල්.එදිරිසූරිය
08. එම්.පී.එන්.මදුරංගනි
09. එම්.ඩී.එස්.එච්.සිල්වා
10. ඊ.එස්.කේ.එම්.අයි.බී.ඒකනායකය
11. එස්.එම්.සී. මල්කාන්ති
12. ජේ.චමිලා රංජනී
13. එච්.ඩබ්.ඩී.අවන්ති
14. සී.යූ.සමරවික්‍රම
15. ඩබ්.ඒ.එස්.කුමාර
16. ටී.එම්.දමයන්ති
17. කේ.ජී.කල්යාණි
18. එම්.එම්.එස්.ප්‍රේමරත්න
19. එස්.වී.පී.චන්දිම
20. එස්.ක්‍රිෂාන්ති
21. වයි.රේණුකා
22. කේ.යූ.එච්.වනිගසිංහ
23. කේ.ආර්.එස්.දිසානායක
24. ඒ.ජී.ඩී.රූපසිංහ

මෙකී කාර්මික ආරාවුල සම්බන්ධයෙන් පැමිණිලිකාර පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය 2023.04.11 දින කැඳවන ලද අතර ඒ ඒ පාර්ශ්වයන්ගේ පළමු විස්තර ප්‍රකාශ 2023.04.25 දිනට පෙර ලබාදිය යුතු බවත් එමෙන්ම නැවත පරීක්ෂණය 2023.04.27 දින කැඳවීමටත් නියෝග කෙරුණි. එම නියෝග අනුව පළමු පාර්ශ්වය තම පළමු විස්තර ප්‍රකාශය 2023.04.25 දින ලබා දී තිබුණි. දෙවන පාර්ශ්වය තම පළමු විස්තර ප්‍රකාශය 2023.04.27 වැනි දින එනම් පරීක්ෂණ දින ලබාදී තිබුණි. මෙම පළමු විස්තර ප්‍රකාශය නියෝගය පරිදි නියමිත පරිදි ලබා දීමට ප්‍රමාදය වශයෙන් දෙවන පාර්ශ්වය දන්වා සිටියේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සමථයකට සාකච්ඡා කරන ලද නමුත් එය අසාර්ථක වු බවය . එමෙන්ම පළමු පාර්ශ්වය විසින් මෙම පෙත්සමට අදාළව තවත් පැමිණිලිකරුවන් දෙදෙනෙකු ඇතුලත් කර ගන්නා ලෙස සිදුකල ලිඛිත ඉල්ලීම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඊළඟ නඩු දිනයට කල් තබන ලදි. මෙම පරීක්ෂණය තුළින් දෙපාර්ශ්වයට දෙවන ප්‍රතිඋත්තර විස්තර ප්‍රකාශ 2023.05.15 දින ලබා දීමට නියෝග කරන ලද අතර යළිත් පරීක්ෂණය 2023.05.16 දින කැඳවීමට නියෝග කරන ලදි.

පරීක්ෂණය 2023.05.16 දින ප.ව.2.30 ය ආරම්භ කරන ලදි. දෙවන ප්‍රතිඋත්තරය නියමිත පරිදී ලබාදී ඇති බව දෙපාර්ශ්වය පිළිගන්නා ලදි. පළමු පාර්ශ්ව විසින් මෙම පෙත්සමට අදාළ තවත් පැමිණිලි කරුවන් දෙදෙනෙක් ඇතුළත්කර ගන්නා ලෙස සිදු කළ ලිඛිත ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලදි. මෙදින පරීක්ෂණ අවස්ථාවේ පළමු විස්තර ප්‍රකාශ හා දෙවන විස්තර ප්‍රකාශ පදනම් කරගෙන දෙපාර්ශ්වයට වැඩි දුරටත් කරුණු කීමට අවස්ථාව සලසා දෙන ලදි.

ලිඛිත කරුණු දැක්වීමට හා ඒ ඒ පාර්ශ්වයන් විසින් ලබාදුන් පළමු හා දෙවන විස්තර ප්‍රකාශ බේරුම්කරණය මගින් විසඳිය යුතු ප්‍රශ්න හා ප්‍රදානයන් පහත දක්වමි. දෙපාර්ශ්වයේ කරුණු සලකා බැලීමට අනුව මෙම බේරුම්කරණය මගින් විසඳීමට ඇති ප්‍රශ්න පහත සඳහන් පරිදි දක්වා සිටිමි.

01. 2009 වර්ෂයෙන් පසු උපාධිධාරීන් බඳවා ගැනීමේදි සහ ශේණි උසස්වීම් ලබා දීමේදී 2005 වර්ෂයේ දී බඳවා ගනු ලැබූ උපාධිධාරීන් හට වර්ෂ 8 ක සේවා පළපුරුද්දෙන් පසුව ලබා දී ඇති JM -1-1 (grade) 1 ශ්‍රේණි උසස්වීම් 2009 වර්ෂයෙන් පසු බඳවාගත් පෙත්සම්කාර උපාධිධාරීන්හට ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද ?

02. එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද ?

ඉහත විසදිය යුතු ප්‍රශ්න සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සම්පින්ඩනය කරමි.

01. මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ පාලන විසින් නිකුත් කළ 2014.11.04 දිනැති ලිපිය මගින් නැවත 2005 වර්ෂයේ බඳවාගනු ලැබූ උපාධිධාරීන්ට JM -1-1(c) හෙවත් JM -1-1 (grade ) II හි වසර 5 ක සේවාකාලය සලකා 2013.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි JM -1-1 (grade) (1) 24725-550 X 17-34075 හෙවත් JM -1-1 grade 1 ශ්‍රේණියට උසස් කර ඇත.

02. 2009 වර්ෂයේදී බඳවා ගත් උපාධිධාරීන්ට 2005 වර්ෂයේ බඳවාගනු ලබූ උපාධිධාරීන් හා සමානව ශ්‍රේණි උසස්වීම් ලබා නෙදීමේ ගැටලුව පිළිබඳව දිගින් දිගටම මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලනය සහ පෙත්සම්කාර සංගමය සාකච්ඡා කොට ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2009 වර්ෂයේ සිට උපාධිධාරීන් බඳවා ගැනීමේ සහ ශ්‍රේණි උසස්වීම් ලබා දීමේ දී විෂමතා සිදුවී ඇති බවට ඉදිරිපත් වී ඇති අභියාචනා සලකා බැලීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනාරාල්ගේ සභාපතිත්වයෙන් 05 පුද්ගල කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව විසින් 2005 හා 2009 වර්ෂයේ තම උපාධිධාරීන් බඳවා ගැනීමේදි සහ ශ්‍රේණි උසස් වීම් ලබා දීමේදි විෂමතා සිදුව ඇති බවට ඉදිරිපත් වී ඇති අභියාචනා සම්බන්ධ කමිටු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව තුළ 2005 හා 2009 දී උපාධිධාරීන් බඳවා ගැනීමේදි හා ශ්‍රේණි උසස්වීම් ලබා දීමේදී විෂමතාවයක් පවතින බව පෙන්වා දී තිබේ. එමෙන්ම 2009 දී බඳවාගත් උපාධිධාරීන් හටද 2005 දී බඳවා ගත් උපාධිධාරීන්ට ලබා දුන් ශ්‍රේණි උසස් වීම් ලබා දීම නිර්දේශ කොට ඇත. ඒ අනුව වසර 03 ක සේවා කාලයක් සඳහා එනම් 2012 දක්වා 2009 බඳවා ගත් උපාධිධාරීන්ටද නියමිත ශ්‍රේණි හා උසස්වීම් ලබා දී හිඟ වැටුපද ලබා දී ඇත.

03. ව්‍යාපෘති කළමනාකරණ ඒකක වල සිට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත බඳවාගත් මෙම පැමිණිලි කරුවන්ට මෙන්ම 2005 තුළ බඳවා ගත් රැකියා විරහිත උපාධිධාරීන්ටද ඒ අනුව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් වලට පටහැනිව වසර 03 කට පසුව JM - 1- 1 දරන වැටුප් තලයෙහි පිහිටුවා ඇත. නිසි බඳවා ගැනීම් පටිපාටි අනුමත කර ගැනීම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය මත කටයුතු කිරීම මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම වුවද එම අධිකාරිය තම අධිකාරී බලය මත මුලින් කටයුතු කොට පසුව ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ඉල්ලා ඇත.

04. මාර්ග සංවර්ධන අධිකාරිය 2009 දී කාර්ය මණ්ඩල දර්ශනය සඳහා අනුමැතිය ලබා ගෙන ඇතත් බඳවා ගැනීමේ පටිපාටි සකසා අනුමැතිය ලබා ගෙන නොමැත. ගත වූ කාලය දෙස බලන විට මෙම බඳවා ගැනීමේ පටිපාටි සකසා නිසි අනුමැතිය ලබා නොගැනීම මාර්ග සංවර්ධන අධිකාරියෙහි කළමණාකාරීත්වයේ දුර්වලතාවයක් වේ.

05. මාර්ග සංවර්ධන අධිකාරිය රජයේ ආයතනයක් වන බැවින් රජයේ විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් වේ. එමෙන්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට වගකිව යුතු ආයතනයකි. එසේ තිබියදී නිසි අනුමැතියෙන් තොරව කාර්ය මණ්ඩල සඳහා වැටුප් පරිමාණ හා උසස්වීම් නිර්දේශ කොට ඇත. මෙහිදී වඩාත් වැදගත් කරුණ වන්නේ අතීතයේදී පාලන අධිකාරිය වැරදි තීරණ ගනු ලැබූ බවට චෝදනා කරන වත්මන් පාලන අධිකාරිය එම වැරදි තීරණ ගත් බලධාරීන්ට එරෙහිව කිසිඳු පරිපාලන හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් නොගෙන සිටීමයි.

06. 2005 වර්ෂයේදී බඳවාගත් උපාධිධාරීන්හට ලබා දී ඇති වැටුප් පරිමාණය හා උසස්වීම් 2009 වර්ෂයේදී බඳවාගත් උපාධිධාරීන්ට ලබා නොදීමෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙහි පාලන අධිකාරිය එකම සේවයේ කටයුතු කරන හා තවමත් රාජකාරි වල නියුතු දෙපිරිසකට දෙයාකාරයකින් සැලකීම හිතාමතාම සිදු කර ඇති ක්‍රියාවක් බව පැහැදිලි වේ. සනාත වේ.

ප්‍රදානය

පැමිණිලිකාර පළමු පාර්ශ්වය වන ඉඩම්, සමාජ හා පරිසර කටයුතු පිළිබඳ ඒකාබද්ධ වෘත්තිකයන්ගේ සංගමය හා වගඋත්තරකාර පාර්ශ්වය වන මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද පළමු ප්‍රකාශන, දෙවන ප්‍රකාශන, කරුණු විමසීම් හා සාක්ෂි සළකා පහත සඳහන් තීරණ වලට එළැඹියෙමි.

2009 වර්ෂයෙන් පසු උපාධිධාරින් බඳවා ගැනිමේදී සහ ශ්‍රේණි උසස්වීම් ලබා දීමේදී, 2005 වර්ෂයේ බඳවාගත් උපාධිධාරීන් හට වර්ෂ 08 ක සේවා පළපුරුද්දකින් පසුව ලබා දී ඇති JM-1-1 (grade 1) ශ්‍රේණි උසස්වීම් 2009 වර්ෂයෙන් පසු බඳවා ගත් පහත සඳහන් උපාධිධාරින්ටද හිමි විය යුතුය.

01. ජේ. එම්. එස්. සි. ජයවර්ධන
02. වී. ඒකනායක
03. සී. ඩබ්. එස්. ප්‍රනාන්දු
04. කේ. ඒ. සී. ආර්. පෙරේරා
05. ඩබ්. ඒ. ඒ. එන්. විජේසිංහ
06. පී. ඒ. පී. කුමාර
07. ඊ. එම්. සී. එල්.එදිරිසූරිය
08. එම්. පී එන් මදුරංගනී
09. එම්. ඩී. එස්. එච්. සිල්වා
10. ඊ. එස්.කේ. එම්. අයි. බී. ඒකනායක
11. එස්. එම්.සී.මල්කාන්ති
12. ජේ.චමිලා රන්ජනී
13. එච්. ඩබ්. ඩී. අවන්ති
14. සී. යූ. සමරවික්‍රම
15. ඩබ්. ඒ. එස් කුමාර
16. ටී.එම්.දමයන්ති
17. කේ.ජී. කල්‍යාණි
18. එම්.එම්. එස්. ප්‍රේමරත්න
19. එස්. වී. පී. චන්දිම
20. එස්. ක්‍රිෂාන්ති
21. වයි.රේණුකා
22. කේ.යූ. එච්. වනිගසිංහ
23. කේ.ආර්.එස්.දිසානායක
24. ඒ.ජී.ඩී.රූපසිංහ

අදාල ශ්‍රේණි උසස්වීම් ලබා නොදීම යුක්ති සහගත නොවන බවත් ඔවුනට හිමි හිඟ වැටුප්, හිඟ දීමනා නොගෙවීමෙන් මූල්‍ය අවාසියක් සිදුවී ඇති බවත් නිරීක්ෂණය කරමි. එමෙන්ම ඔවුනට වසර අටක සේවා කාලය ඇවෑමෙන් JM-1-1 (grade 1) ශ්‍රේණි උසස් වීම් ලබා දිය යුතු බවට ද තීරණය කරමි.

මෙම පරීක්ෂණ ක්‍රියාවලිය තුළ ප්‍රමාණවත් කාලයක් ලබා දී තිබුනද පරීක්ෂණය අවසන් වන තුරු වග උත්තරකාර පාර්ශ්වය සාක්ෂි විමසීමක් සඳහා කිසිඳු ඉල්ලීමක් කර නොතිබුණි. එබැවින් මෙම නඩුකරය අවසන් වීමෙන් පසු සිදු කරන ලද එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමි. පැමිණිලිකාර පාර්ශ්වයට ලබා දිය යුතු සහනයන් පිළිබඳ මූල්‍යමය වශයෙන් සිදුකළ ගණනය පිළිබඳවද වගඋත්තරකාර පාර්ශ්වය කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නැත. ඒ අනුව පහත දක්වා ඇති පරිදි පැමිණිලිකාර ඉල්ලුම්කරුවන්ට 2023.04.16 දින දක්වා හිඟ වැටුප් හා හිඟ දීමනා ලෙස 17,898,438.88 ( දහහත් මිලියන අටලක්ෂ අනූඅට දහස් හාරසිය තිස් අටයි සත අසූ අටක්) ගෙවිය යුතු බවට වග උත්තරකාර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත නියෝග කරමි.

| *අනු අංකය* | *පැමිණිලිකරුවන්ගේ නම* | *ගෙවිය යුතු සම්පූර්ණ මුදල (හිඟ වැටුප් හා දීමනා)* |
|---|---|---|
| 01. | ජේ. එම්. එස්. සී. ජයවර්ධන | 733,235.20 |
| 02. | වී. ඒකනායක | 713,164.36 |
| 03. | සී. ඩබ්. එස්. ප්‍රනාන්දු | 736,354.93 |
| 04. | කේ. ඒ. සී. ආර්. පෙරේරා | 784,438.20 |
| 05. | ඩබ්. ඒ. ඒ. එන්. විජේසිංහ | 747,782.20 |
| 06. | පී. ඒ. පී. කුමාර | 713,164.36 |
| 07. | ඊ. එම්. සී. එල්.එදිරිසූරිය | 784,438.20 |
| 08. | එම්. පී එන් මදුරංගනී | 773,376.86 |
| 09. | එම්. ඩී. එස්. එච්. සිල්වා | 713,164.36 |
| 10. | ඊ. එස්.කේ. එම්. අයි. බී. ඒකනායක | 713,164.36 |

| අනු අංකය | පැමිණිලිකරුවන්ගේ නම | ගෙවිය යුතු සම්පූර්ණ මුදල (හිඟ වැටුප් හා දීමනා) |
|---|---|---|
| 11. | එස්. එම්.සී.මල්කාන්ති | 713,164.36 |
| 12. | ජේ.චමිලා රංජනී | 699,337.80 |
| 13. | එච්. ඩබ්. ඩී. අවන්ති | 747,789.20 |
| 14. | සී.යූ. සමරවික්‍රම | 713,164.36 |
| 15. | ඩබ්. ඒ. එස් කුමාර | 713,164.36 |
| 16. | ටී.එම්.දමයන්ති | 773,376.86 |
| 17. | කේ.ජී. කල්‍යාණි | 713,164.36 |
| 18. | එම්.එම්. එස්. ප්‍රේමරත්න | 733,007.03 |
| 19. | එස්. වී. පී. චන්දිම | 713,164.36 |
| 20. | එස්. ක්‍රිෂාන්ති | 773,376.86 |
| 21. | වයි.රේණුකා | 809,980.29 |
| 22. | කේ.යූ. එච්. වනිගසිංහ | 912,078.29 |
| 23. | කේ.ආර්.එස්.දිසානායක | 758,232.36 |
| 24. | ඒ.ජී.ඩී.රූපසිංහ | 713,164.36 |
| | ගෙවිය යුතු සම්පූර්ණ මුදල | 17,898,438.88 |

පැමිණිලිකාර පළමු පාර්ශ්වය වන ඉහත නම් සඳහන් උපාධිධාරීන් වෙනුවෙන් මෙම නියෝගය ක්‍රියාත්මක කොට *ගැසට් පත්‍රයේ* පළවී දින 30 ක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස්, නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලය වෙත රුපියල් 17,898,438.88 ක මුදල ගෙවන මෙන් දෙවන පාර්ශ්වයේ වගඋත්තරකාර ආයතනය වන මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මෙයින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි. ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම ප්‍රදානය කිසිදු බාධාවක් නොවෙයි.

ආචාර්ය කේ.ඒ. තිලකරත්න,
බේරුම්කරු,

2023 ජුලි මස 11 වැනි දින.

EOG 08 - 0077

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.